**2.2.3 නොසැසඳු ශේෂ**

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය තුළ වියපැහැදම් කරන ලද රු.මිලියන 858.64 ක් වූ මුදල, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 829.23 ක් වූ අනුරූපී මුදල සමඟ එකඟ වී නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | ණය සහ ප්‍රදාන ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 164.20 | 17,689.20 | 807.00 | 4.47 | 684.60 | 135.80 | 18,880.70 |
| ශ්‍රී ලං ර | 24.00 | 2,585.60 | - | - | - | - | - |
| ලංවිම | - | - | 12.00 | 4.31 | 660.60 | 17.40 | 2,673.60 |
| **එකතුව** | **188.20** | **20,274.80** | **882.00** | **8.78** | **1,345.20** | **153.20** | **21,554.30** |

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ආධාර දෙනු ලබන නියෝජිත ආයතනය විසින් මූල්‍යයනය කිරීමට එකඟ වූ රු.මිලියන 17,689.2 කට සමාන එජඩො මිලියන 164.2 ක ප්‍රතිපාදනවලින් සියයට 83 ක් වූ රු.මිලියන 18,880.7 කට සමාන එජඩො මිලියන 135.8 ක් පමණක් ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසානයට, එනම් ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු අරඹා වසර 07 ක් ඉක්මවූ පසු උපයෝජනය කර තිබුණි. තවද, ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ණය දෙනු ලබන නියෝජිතායතනය විසින් රු.මිලියන 31.6 ක බැඳීම් ගාස්තු අයකර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය හා දිළිඳු පුද්ගලයන් සඳහා ප්‍රවේශය යන සංරචක 03 යටතේ ව්‍යාපෘතියේ කටයුතු කොටස් 08 කින් සමන්විත වන අතර, ඉන් කොටස් 06 ක් 2015 දෙසැම්බර් 31 වන විට නිම කර තිබුණි. බලශක්ති කාර්යක්ෂමතා

වැඩිදියුණු කිරීම ව්‍යාපෘතිය යටතේ ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු මාස 04 ක ප්‍රමාදයක් සහිතව 2018 අප්‍රේල් 30 දින නිමකර තිබුණි. 2014 නොවැම්බර් 12 දින ආරම්භ කරන ලද කැළණිය-වවුනියා වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය යටතේ වූ කාර්යයන් 2016 මැයි 12 දින නිමකර තිබුණු අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිමකිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ග්‍රාමීය විදුලිබල කටයුතු සඳහා ද්‍රව්‍ය හා උපකරණ ප්‍රසම්පාදනය කිරීම යටතේ කාර්යයන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිමකර නොතිබුණි.

## 3.3 මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ අධීක්ෂණ හා නියාමන කටයුතු, ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන සියලුම මූල්‍යාධාර ව්‍යාපෘතිවල අධීක්ෂණය සඳහා වගකීම් දරනු ලබන අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) වෙත පවරනවා වෙනුවට, ලංකා විදුලිබල මණ්ඩලයේ විවිධ අංශ ප්‍රධානීන් යටතේ පවතී.

(ආ) මුදල් රෙගුලාසි 133 සහ අංක 05 සහ 2010 ජූලි 26 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛයෙන් නියම කර ඇති පරිදි, ව්‍යාපෘතියේ ගනුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකයේ විගණනයට භාජනය වී නොතිබුණි.

## 3.4 ඌන උපයෝජිත වත්කම්

ග්‍රාමීය විදුලිබල කටයුතු පිළිබඳ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 1,003.16 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද ද්‍රව්‍ය, 2017 දෙසැම්බර් 31 දිනට අවුරුදු 02 කට වැඩි කාලයක් අරමුණුගත කාර්යයන් සඳහා උපයෝජනය නොකර ගබඩාවල රඳවා තිබුණි.